# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report
















## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
## கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
## Department of Animal Production and Health

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2018

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்**

**Department of Animal Production and Health**

**Peradeniya**

**Sri Lanka**

**Tel : 94 - 081 – 2388337 / 2388462**

**Fax : 94 – 081 - 2388619**

**Web Site: www.daph.gov.lk**

# පටුන


පිටු අංකය

| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම | 1 |
| 2. | 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය | 3 |
| | 2.1. පශු සම්පත් සංවර්ධනය | 3 |
| | 2.2. මානව සම්පත් සංවර්ධනය | 6 |
| | 2.3. නීතිමය කටයුතු සහ සේවාවන් | 7 |
| | 2.4. පශු මහජන සෞඛ්‍ය සේවාවන් | 9 |
| | 2.5. 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය | 10 |
| | 2.6. මූල්‍ය ප්‍රතිපාදන සහ වියදම් සාරාංශය - 2018 | 11 |
| | 2.7. මූල්‍ය ප්‍රතිපාදන සහ වියදම් - 2018 | 11 |
| | 2.8. දෙපාර්තමේන්තු ආදායම් සාරාංශය - 2018 | 12 |
| | 2.9. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම | 12 |

## 1. හැඳින්වීම

1978 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනය වෙයි. වර්තමානයේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රටතුල සත්ත්ව රෝග පැතිරීම වලක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදු කරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නඟා සිටුවීමට අදාල ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩ සටහන්ද වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාල නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ.

පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරිණි.

ජාතික සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික නායකත්වය, විශේෂඥ සේවා හා සහාය සේවා පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වලට ලබා දීම තුලින් පශු සම්පත් කර්මාන්තය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටු කරනු ලබයි. පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන් වේ. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 332 මඟින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

### දැක්ම

පශු සම්පත් ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා මෙහෙයවන ප්‍රමුඛතම ආයතනය වීම.

### මෙහෙවර

නිරෝගීමත් සත්ත්ව ගහණයකින් හා වැඩි නිෂ්පාදන ඵලදායීතාවයකින් යුක්තව ආහාර සුරක්ෂිතතාවයට දායකවීමෙන් හා ආහාරයන්හි සෞඛ්‍ය ආරක්ෂිතභාවයද තහවුරු කරමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් ලඟා කර ගැනීම සඳහා තාක්ෂණික මග පෙන්වීම හා සහාය ලබා දීමයි.

## අරමුණු

- සත්ත්ව රෝග වැළැක්වීම සහ මර්ධනය සඳහා කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම.
- සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම.
- ගුණාත්මක සත්ත්ව ආහාර සහ ආහාර සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම.
- සත්ත්ව ආහාර කර්මාන්තයේ වර්ධනය සහ සංවර්ධනය ප්‍රචලිත කිරීම.
- තිරසාර පශු සම්පත් සංවර්ධනයක් උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් පවත්වාගෙන යාම.
- තාක්ෂණික සවිබල ගැන්වූ මානව සම්පත් සංවර්ධනය කිරීම.
- කාර්යක්ෂම සේම ඵලදායී ලෙස තොරතුරු බෙදාහැරීම සහ තාක්ෂණික සේවා සැපයීම තහවුරු කිරීම.
- ව්‍යාපෘති සහ වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඇගයීම.
- සත්ත්ව නිෂ්පාදනවල ආරක්ෂිතභාවය තහවුරු කිරීම.
- විධිමත් සත්ත්ව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඊට පහසුකම් සැපයීම.
- සතුන්ගේ සුභසාධනය සහ යහපැවැත්ම තහවුරු කිරීම.
- දෙපාර්තමේන්තු කාර්යයන් කාර්යක්ෂමව කළමණාකරනය කිරීම සඳහා වගබලා ගැනීම.

## 2. 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය

### 2.1. පශු සම්පත් සංවර්ධනය

### 2.1.1. කිරි ගව ක්ෂේත්‍රය

**අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම**

නිෂ්පාදනය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය සම්පන්න සත්ත්ව ගහණයක් පවත්වාගෙන යාමට, මුළු දිවයින පුරා පැතිරුණු රෝග වැලැක්වීම හා මර්ධනය කිරීම පිණිස වන සාර්ථක සත්ත්ව සෞඛ්‍ය සේවාවක් ලබා දීම උපරිම වැදගත් කමින් යුතු වූවක් වෙයි. ශ්‍රී ලංකාවේ බෝවන සත්ත්ව රෝග පැතිරීම වැලැක්වීම සඳහා ප්‍රතිශක්තිකරණ එන්නත් කිරීම, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සමඟ එක්වී ක්‍රියාත්මක කෙරේ.

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ බෘසෙල්ලා රෝග සඳහා වන එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරන ලදී.

විමර්ශනයට භාජනය වූ කාලය තුළ කුර හා මුඛ රෝග එන්නත් වඩි 244,890 ක්, රක්තාශ්‍රව රෝග එන්නත් වඩි 335,390 ක්, කාලගාත්‍රා එන්නත් වඩි 180,642 ක් සහ බෘසෙල්ලා එන්නත් වඩි 7,500 ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරනු ලැබූ අතර, 2018 වසර අවසාන වන විට සතුන් 806,304 ක් සඳහා කුර සහ මුඛ රෝග එන්නතද, සතුන් 230,359 ක් සඳහා රක්තාශ්‍රව රෝග එන්නතද, සතුන් 140,143 ක් සඳහා කාලගාත්‍රා රෝග එන්නතද, සතුන් 4,401 ක් සඳහා බෘසෙල්ලා එන්නතද ලබාදී තිබේ.

**ආ. සතුන්ගේ ආරය වැඩිදියුණු කිරීම සහ සතුන් අභිජනනය**

රට තුළ කිරි නිෂ්පාදනය වැඩිකිරීම උදෙසා දේශීය එළ ගව සහ මී ගව ගහනය ගුණාත්මකව වැඩිදියුණු කර ගැනීමට උසස් ආරයේ ගව ශුක්‍ර භාවිතා කර කෘත්‍රිම සිංචන කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රධාන සත්ත්ව අභිජනන වැඩසටහන වේ. ශුක්‍ර වඩි නිෂ්පාදනය කර බෙදාහැරීම, කෘත්‍රිම සිංචන ශිල්පීන් පුහුණු කිරීම, තෘණ හා පෝෂ තෘණ වර්ග හඳුන්වාදීම හා සංවර්ධනය සහ තෘණ වගාව පිළිබඳ පුහුණුව මෙම වැඩසටහනේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය. මෙම වසර තුළදී, කුණ්ඩසාලේ සහ පොළොන්නරුවේ පිහිටි කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන 02 මඟින් ශුක්‍ර වඩි 325,945 ක් නිෂ්පාදනය කළ අතර, ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් කෘත්‍රිම සිංචන 229,418 ක් සිදුකර තිබේ. ක්ෂේත්‍රයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් කෘත්‍රිම සිංචනය කරන ලද එළදෙනුන් / වැස්සියන් සඳහා ගැබ් පරීක්ෂාවන් 74,101 ක් සිදුකර ඇත. විමර්ශනයට භාජනය වූ කාලය තුළ පැටව් උපත් 69,520 ක් වාර්තා වී ඇත.

**ඈ. වැස්සි පැටවුන් ඇති දැඩි කිරීමේ වැඩසටහන**

කෘත්‍රිම සිංචනයේ සැබෑ ප්‍රතිලාභ අත්කර ගැනීමට මෙන්ම ජාතික කිරි නිෂ්පාදනය වැඩිකිරීමට කෘත්‍රිම සිංචන සේවය මගින් උපත ලැබූ වැස්සි පැටවුන් නියමිත පරිදි රැකබලා ගැනීම ගොවිපොළ මට්ටමේදී බලපාන ප්‍රධාන ගැටළුවයි. රට තුළ අභිජනනයට සුදුසු වැස්සියන්ගේ ගහනය වැඩිකිරීමටද, එමගින් දේශීය කිරි නිෂ්පාදනය නංවාලීමට තුඩු දෙන පරිදි කෘත්‍රිම සිංචනය මගින් උපන් වැස්සි පැටවුන් ලියාපදිංචි කර තාක්ෂණික උපදෙස් සේවාවන් සහ අවශ්‍ය යෙදවුම් සඳහා සහනාධාර ගෙවීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ. සමාලෝචිත කාලසීමාව තුළදී වැස්සි පැටවුන් 25,602 ක් ලියාපදිංචි කර ඇත.

**ඈ. පශු පර්යේෂණ ආයතනය තුල කිරි තාක්ෂණ පරීක්ෂණාගාරයක් පිහිටුවීම**

කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ තාක්ෂණික විමර්ශන කටයුතු සිදුකිරීම සහ දිස්ත්‍රික් පශු විමර්ශන මධ්‍යස්ථාන සම්බන්ධීකරණය සඳහා කේන්ද්‍රස්ථානයක් හා විශේෂ පරීක්ෂණාගාරයක් පශු පර්යේෂණ ආයතනය තුළ ස්ථාපිත කර ඇත. එමෙන්ම කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා කිරි සැකසුම්කරුවන්ට සහායවීමද මෙමගින් අපේක්ෂා කෙරේ. තවද, ස්ථාපිත කරන ලද කිරි තාක්ෂණ පරීක්ෂණාගාරය මගින් විශ්ලේෂණ හා උපදේශන සේවා සැපයීම, පරීක්ෂණාගාර පහසුකම් ලබාදීම, ක්ෂේත්‍ර විමර්ශනයන් සිදුකිරීම සහ පුහුණු කිරීම ආදිය සිදුකරනු ලැබේ. සමාලෝචිත කාලසීමාව තුළ කිරි සාම්පල 953 ක් විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර ඇත.

**ඉ. බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන**

බුරුළු ප්‍රදාහ රෝග තත්ත්වය සියයට 30 සිට 1 දක්වා අඩු කිරීම මගින් නිෂ්පාදන ඵලදායීතාවය සියයට 25ක් දක්වා වැඩිකිරීමේ අරමුණින් මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. සමාලෝචිත කාලසීමාව තුළ බුරුළු නික්ෂේපන 47,112 ක් නිෂ්පාදනය කරන ලදී.

### 2.1.2. එළු ක්ෂේත්‍රය

උසස් ආරයේ අභිජනන එළුවන් සඳහා පවතින ඉල්ලුමට සරිලන ලෙස ඉඹුලන්දණ්ඩ සහ තෙලහැර පිහිටි එළු අභිජනන ගොවිපොළවල් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙම කාලය තුළදී නිෂ්පාදනය සහ ඵලදායිතාවය වැඩිකර ගැනීම උදෙසා එළු පාලනයේ නිරත ගොවීන්ට ජමුනාපාරි එළුවන් 175 දෙනෙකු ලබා දී තිබේ. තවද, එළු ගහනය වැඩිකිරීම උදෙසා 2018 වසර අවසාන වනවිට ක්ෂේත්‍ර මට්ටමින් කෘත්‍රිම සිංචනයන් 3,042 ක්ද සිදුකර තිබේ.

### 2.1.3. කුකුළු ක්ෂේත්‍රය

මෙරට කුකුළු කර්මාන්තය තුළ නිෂ්පාදනය පෞද්ගලික අංශය මගින් සිදුකරනු ලබන කාර්යයක් වන අතර රාජ්‍ය අංශයේ කාර්යභාරය නීති සහ තත්ත්ව සහතික කිරීමට පමණක් සීමාවී ඇත. සමහර රට වල කුරුළු උණ ව්‍යාප්ත වීමේ හේතුවෙන් මව් පිය සහ මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන් මෙරටට ආනයනය කිරීමේදී සීමාවන් පනවා එම රෝගය මෙරටට සංක්‍රමණය වීම වැලැක්වීමට ගුවන් තොටුපල හා වරායන්වල පිහිටුවා ඇති සත්ත්ව නිරෝධායන කාර්යාල මගින් විශේෂ රෝග වලක්වාලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

වර්තමානයේ බ්‍රොයිලර් මාපිය සතුන්ගේ අවශ්‍යතාවයෙන් සියයට 75.34 ක් මෙරට බ්‍රොයිලර් මුතුන් මිත්තන් ඇති කරන ගොවිපල 03 මගින් නිපදවයි. 2018 වසර අවසානය වන විට බ්‍රොයිලර් මාපිය පරම්පරාවට අයත් සතුන් 981,173 ක් මෙරට තුළදී මෙම ගොවිපල 03 මගින් නිෂ්පාදනය කර තිබේ. මීට අමතරව බ්‍රොයිලර් මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන් 28,986 ක්, බ්‍රොයිලර් මාපිය පරම්පරාවට අයත් සතුන් 321,112 ක් සහ ලේයර් මාපිය පරම්පරාවට අයත් සතුන් 63,095 ක් මෙරටට ආනයනය කොට තිබේ.

අභිජනන ගොවිපල මගින් මෙම කාලය තුලදී බ්‍රොයිලර් පැටවුන් මිලියන 140.24 ක් ද, බිත්තර දමන කිකිළි පැටවුන් මිලියන 7.57 ක් ද නිෂ්පාදනය කරනු ලැබ ඇත.

එසේම, කුඩා පරිමාණ කුකුළු පාලන ගොවීන්ට නොමිලේ බෙදාදීම සඳහා පශු පර්යේෂණ ආයතනය විසින් රැනිකට් රෝගය සඳහා එන්නත් නිපදවනු ලැබේ. සමාලෝචිත කාලසීමාව තුළදී, රැනිකට් එන්නත් සාර වඩි 6,699,200 ක් නිෂ්පාදනය කර ඇත. 2018 වසර අවසාන වන විට කුකුළන් 3,185,583 ක් සඳහා රැනිකට් එන්නත ලබාදී ඇත.

## 2.1.4. සත්ත්ව සෞඛ්‍යය වැඩි දියුණු කිරීම

### අ. කුරුලු උණ මෙරටට ඇතුළු වීම වැලැක්වීම

ආසියාවේ රටවල් කිහිපයක ආර්ථිකයට බලපෑ අති ව්‍යාධිජනක කුරුළු උණ රෝගයෙන් තොර රටක් ලෙස පැවතීමට ශ්‍රී ලංකාවට මේ දක්වා හැකියාව ලැබී ඇත. මෙරටට අති ව්‍යාධිජනක කුරුළු උණ රෝගය ඇතුළු වුවහොත්, එම රෝගය මැඩපැවැත්වීමට හා තුරන් කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විධිමත් සැලැස්මක් සූදානම් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් රෝග ආවේක්ෂණ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

පශු පර්යේෂණ ආයතනය සතු රෝග විනිශ්චය කිරීමේ පහසුකම් පුළුල් කරන ලදී. ජාතික සහ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීන්ට අති ව්‍යාධිජනක කුරුළු උණ රෝගය වැලැක්වීමට සහ මැඩලීමට සම්බන්ධ පුහුණුවීම් ලබා දී ඇත.

මෙම අති ව්‍යාධිජනක කුරුළු උණ විමර්ශන වැඩසටහන යටතේ, ක්ෂේත්‍රයෙන් ලබාගත් සාම්පල 15,625 ක් මෙම කාලය තුළදී පරීක්ෂාවට භාජනය කරනු ලැබ ඇති අතර, ඒවා රෝගයෙන් තොර බවට නිශ්චය කෙරිණි.

### ආ. සත්ත්ව නිරෝධායන සහ පරීක්ෂා කිරීමේ සේවාව ශක්තිමත් කිරීම

මෙරටට යම්කිසි ආගන්තුක (විදේශීය) සත්ත්ව රෝගයක් ඇතුළුවීමට එරෙහිව ඇති පළමු ඉදිරි ආරක්ෂක ක්‍රමය සත්ත්ව නිරෝධායන සේවාවයි. අභිජනන කුකුළන් ආනයනය කිරීමෙන් පසු නිරෝධායනය කිරීමට හා අපනයන වෙළෙඳපොළ සඳහා වන විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මක බවින් නගා සිටුවීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ආනයනය කළ දිනක් වයසැති කුකුළු පැටවුන් කණ්ඩායම් 61 ක් සමාලෝචිත කාලසීමාව තුළදී මෙම වැඩසටහන යටතේ නිරෝධායන පරීක්ෂාව භාජනය කරන ලදී. මීට අමතරව, මත්ස්‍ය ගොවිපොළවල් 48 ක්ද පරීක්ෂාවට ලක් කරන ලදී.

**ඇ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම**

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මගින් උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම තවදුරටත් පුළුල් කිරීම සිදු කෙරේ. දැනට නිෂ්පාදනය කරන එන්නත් වල තත්වය වැඩිදියුණු කිරීමත්, නව එන්නත් අළුතෙන් නිෂ්පාදනයත් අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2018 වසරේදී කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා, බෘසෙල්ලා සහ රැනිකට් ඇතුළු එන්නත් දේශීයව නිපදවීමට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කර ඇත.

**ඈ. පශු විමර්ෂණ මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම**

මෙම ව්‍යාපෘතිය මගින් හඳුනාගත් පශු විමර්ෂණ මධ්‍යස්ථාන වල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ කටයුතු ප්‍රාදේශීයව සිදුකිරීම සඳහා පරීක්ෂණාගාර නවීකරණය කිරීම සිදු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2018 දෙසැම්බර් මාසය වනවිට නවීකරණ කටයුතු වලින් 60% ක් පමණ අවසන් කර ඇත.

## 2.2. මානව සම්පත් සංවර්ධනය

**අ. හැකියා වර්ධනය, අධ්‍යාපනය සහ පුහුණු**

දෙපාර්තමේන්තුව විසින් නවීන ප්‍රායෝගික සත්ත්ව පාලන කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරීන් සහ ගොවීන්ට හැකියා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. සමාලෝචිත කාල සීමාව තුළදී පුහුණු වැඩසටහන් 15 ක් පවත්වා ඇති අතර, ව්‍යවසායකයින්/ නිලධාරීන් සහ ගොවීන් 505 ක් සඳහා පුහුණුව ලබාදී ඇත.

**ආ. තොරතුරු බෙදාහැරීම**

දෙපාර්තමේන්තුව ජාතික මට්ටමින් පවත්වන ලද ප්‍රදර්ශන 08 කට සහභාගීත්වය දක්වා ඇත. ඒවා පහත පරිදිවේ.

| ප්‍රදර්ශනයේ නම | පවත්වන ලද ස්ථානය |
|---|---|
| යොවුන් පුරය - 2018 | නිකවැරටිය |
| "*Lanka Pet Expo* - 2018" ප්‍රදර්ශනය | *BMICH*, කොළඹ |
| "*SHIZEN 18*" - ගෝතමී බාලිකා විද්‍යාලයීය වාර්ෂික විද්‍යා ප්‍රදර්ශනය | කොළඹ |
| පැලව මහ විදුහලේ ප්‍රදර්ශනය | මුරුතලාව |
| *Vision 2025 - Enterprise Sri Lanka* ප්‍රදර්ශනය | මොණරාගල |
| "සරු දිවියට කෘෂි සවියක්" ප්‍රදර්ශනය | හෝමාගම |
| කෘෂිකර්ම ප්‍රදර්ශණය - 2018 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| "*Harvest - 2018*" කෘෂිකර්ම නවීකරණ ප්‍රදර්ශනය | *BMICH*, කොළඹ |




යොවුන් පුරය - 2018






කෘෂිකර්ම ප්‍රදර්ශනය - 2018 "**Harvest** - 2018" කෘෂිකර්ම නවීකරණ ප්‍රදර්ශනය

දැනට සත්ත්ව පාලන කටයුතුවල නිරතව සිටින්නාවූ කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින්ට සහ සත්ත්ව පාලන කටයුතුවල නිරතවීමට කැමති පාසල් සිසුන් සහ මහජනතාවට නව තාක්ෂණයන් සම්බන්ධ දැනුම සහ තොරතුරු ලබාදීම සිදුකරන ලදී. සමාලෝචිත කාලසීමාව තුළදී තොරතුරු අඩංගු පොත් 35,459 ක් නිකුත් කිරීමට සහ රූපවාහිනී සහ ගුවන්විදුලි ප්‍රචාරක වැඩසටහන් 93 ක් ඉදිරිපත් කිරීමට හැකි වී ඇත.

## 2.3. නීතිමය කටයුතු සහ සේවාවන්

### අ. කුකුළු ගොවිපල ලියාපදිංචි කිරීම

ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීම 2018 වර්ෂයේදීද ක්‍රියාත්මක විය. කුකුළු ගොවිපළවල් ලියාපදිංචි කිරීමේ වැඩසටහන මගින් බෝවන රෝග මර්දනය කිරීම, තාක්ෂණික සහාය වැඩසටහන් පැවැත්වීම සහ සත්ත්ව නිෂ්පාදනවල ගුණාත්මකභාවය පාලනය කිරීම පහසුවෙන් කරගෙන යාමට හැකිවේ. ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් 2018 වසර අවසානය වන විට ගොවිපළවල් 8,808 ක් ලියාපදිංචි කර ඇත. ඉදිරියේදී ඒ සම්බන්ධව විද්‍යුත් දත්ත සමුදායක් ස්ථාපිත කෙරේ.

**ආ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම**

මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදුකරනු ලබයි. මෙම වසර තුල සතුන් 197,900 දෙනෙකුගේ කන් සලකුණු සවිකර ඇත. ඉතිරි සත්ත්ව ගහනය සහ ඔවුන්ගේ පැටවුන් ඉදිරි වර්ෂවලදී හඳුනා ගැනේ. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය හා ඵලදායි නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාර වේ.

**ඇ. රජයේ පශු වෛද්‍ය කාර්යාලයන් මගින් සේවා සැපයීමේ ක්‍රමය දියුණු කිරීම**

ග්‍රාමීය ප්‍රදේශවල සත්ත්ව පාලන අංශයේ නියුතුවූවන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන ක්ෂේත්‍ර මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන් වනුයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලයන්ය. බිම් මට්ටමින් සේවාවන් සැපයීමේ කාර්යක්ෂමතාවය මෙකී කාර්යාලයන් සතුව පවතින පහසුකම් මත රඳා පවතී. රෝග විනිශ්චය කිරීම, ව්‍යාප්ති සේවාවන් සැලසීම සඳහා වන සන්නිවේදන සහ ප්‍රවාහන පහසුකම් සැපයීම සිදු කළ හැකිවී ඇත්තේ අවම මට්ටමෙනි.

පසුගිය වසරේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය පශු වෛද්‍ය කාර්යාලය, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර පශු වෛද්‍ය කාර්යාලය, රත්නපුර දිස්ත්‍රික්කයේ, අයගම පශු වෛද්‍ය කාර්යාලය, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ පශු වෛද්‍ය කාර්යාලය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, අරලගන්විල පශු වෛද්‍ය කාර්යාලය, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, පූඩළුඔය පශු වෛද්‍ය කාර්යාලය සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ, කළුවන්චිකුඩි පශු වෛද්‍ය කාර්යාලය යන පශු වෛද්‍ය කාර්යාලයන්හි ඉදි කිරීම් කටයුතුවලින් සියයට 73 ක් සමාලෝචිත කාල සීමාව අවසානය වන විට නිමවා ඇත. 2018 වසරේදී මොණරාගල දිස්ත්‍රික්කයේ, ඇතිමලේ පශු වෛද්‍ය නිල නිවාසයේ ඉදිකිරීම් කටයුතු නිමකර ඇත.

මේ වනවිට ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය පශු වෛද්‍ය කාර්යාලය, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර පශු වෛද්‍ය කාර්යාලය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, අරලගන්විල පශු වෛද්‍ය කාර්යාලය, රත්නපුර දිස්ත්‍රික්කයේ, අයගම පශු වෛද්‍ය කාර්යාලය, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කළුවන්චිකුඩි පශු වෛද්‍ය කාර්යාලය, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, පූඩළුඔය පශු වෛද්‍ය කාර්යාලය සහ මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ පශු වෛද්‍ය කාර්යාලය යන කාර්යාල හතෙහි ඉදි කිරීම් කටයුතු 2019 වසර සඳහා අවිච්ඡේද වනු ඇත.



ඇතිමලේ පශු වෛද්‍ය නිල නිවාසය

## 2.4. පශු මහජන සෞඛ්‍ය සේවාවන්

**අ. ජලභීතිකා රෝගය පාලනය කිරීමේ හා තුරන් කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන**

ප්‍රාදේශිය පශු වෛද්‍ය කාර්යාල මගින් ජලභීතිකා රෝගය පාලනය කිරීමේ හා තුරන් කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන මෙම වසරේ සිට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සිදුකිරීම ආරම්භ කරන ලදී. සමාලෝචිත කාල සීමාව තුල ජලභීතිකා රෝගය සඳහා එන්නත් වඩි 1,503,570 ක් බෙදා හරින ලද අතර, සතුන් 1,188,354 ක් සඳහා ජලභීතිකා රෝග එන්නත ලබාදී ඇත. සුනඛ ගහණය කළමනාකරණය කිරීම සඳහා වන්ද්‍යාකරණ සැත්කම් 58,599 ක් ද සිදු කර ඇත.

**ආ. ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු සඳහා පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම**

මෙම වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මගින් සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම මගින් අපනයන පහසුකරණය සහ ආහාර ආරක්ෂණය තහවුරු කෙරේ.

## 2.5. 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය

(2018 දෙසැම්බර් 31 දිනට)

| වැඩසටහන / ව්‍යාපෘතිය | මූල්‍ය ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|
| සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන | 2.20 | 2.19 |
| තත්ත්ව ආරක්ෂණ වැඩසටහන | 2.80 | 2.67 |
| සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන | 40.00 | 37.11 |
| පශු සම්පත් පර්යේෂණ වැඩසටහන | 35.00 | 30.28 |
| සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය | 175.00 | 115.84 |
| පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන | 7.50 | 7.36 |
| වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ ව්‍යාපෘතිය | 60.00 | 52.82 |
| පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම | 200.00 | 64.04 |
| කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය | 25.00 | 9.70 |
| සතුන් හඳුනාගැනීමේ වැඩසටහන | 16.00 | 2.55 |
| සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය | 10.00 | 8.47 |
| කිරි තාක්ෂණ පරීක්ෂණාගාරයක් පිහිටුවීම | 5.00 | 3.72 |
| පොත් හා වාර ප්‍රකාශන | 0.50 | 0.50 |
| සත්ත්ව රෝග ආවේක්ෂණය පුළුල් කිරීම | 40.00 | 22.51 |
| කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම | 12.00 | 6.12 |
| බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන | 15.00 | 8.47 |
| උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම | 94.00 | 8.61 |
| ජලභීතිකා රෝගය පාලනය කිරීමේ හා තුරන් කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන | 100.00 | 61.61 |
| වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන | 50.00 | 4.23 |
| පශු විමර්ශණ මධ්‍යස්ථාන වල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම | 26.00 | 2.62 |
| ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු සඳහා පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම | 70.00 | 0.76 |
| සත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම | 14.00 | 4.95 |
| **එකතුව** | **1,000.00** | **457.13** |

## 2.6. මූල්‍ය ප්‍රතිපාදන සහ වියදම් සාරාංශය - 2018

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.) | භාණ්ඩාගාරයෙන් ලැබුණු පරිපූරක ප්‍රතිපාදන (රු.) | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම % ක් ලෙස |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන | 540,700,000 | - | 540,700,000 | 526,256,531 | 97.33% |
| ප්‍රාග්ධන | 1,165,000,000 | - | 1,165,000,000 | 535,369,172 | 45.95% |
| එකතුව | **1,705,700,000** | - | **1,705,700,000** | **1,061,625,703** | **62.24%** |

## 2.7. මූල්‍ය ප්‍රතිපාදන සහ වියදම් - 2018

| | ප්‍රතිපාදන (රු. මිලියන) | වියදම (රු. මිලියන) | 2018.12.31 දිනට ශේෂය (රු. මිලියන) | වියදම ප්‍රතිපාදන වලින් % ක් ලෙස |
|---|---|---|---|---|
| ව්‍යාපෘතිය 1 | | | | |
| ප්‍රාග්ධන වියදම | 178,000,000 | 90,951,760 | 87,048,240 | 51.10% |
| පුනරාවර්තන වියදම | | | | |
| වැටුප් හා වේතන | 431,550,000 | 424,633,218 | 6,916,782 | 98.40% |
| වෙනත් | 109,150,000 | 101,623,313 | 7,526,687 | 93.10% |
| එකතුව | **718,700,000** | **617,208,291** | **101,491,709** | 85.88% |
| | | | | |
| ව්‍යාපෘතිය 2 | | | | |
| ප්‍රාග්ධන වියදම | 500,000,000 | 189,622,210 | 310,377,790 | 37.92% |
| එකතුව | **500,000,000** | **189,622,210** | **310,377,790** | 37.92% |
| | | | | |
| ව්‍යාපෘතිය 3 | | | | |
| ප්‍රාග්ධන වියදම | 487,000,000 | 254,795,202 | 232,204,798 | 52.32% |
| එකතුව | **487,000,000** | **254,795,202** | **232,204,798** | 52.32% |
| | | | | |
| ප්‍රාග්ධන වියදම එකතුව | 1,165,000,000 | 535,369,172 | 629,630,828 | 45.95% |
| පුනරාවර්තන වියදම එකතුව | 540,700,000 | 526,256,531 | 14,443,469 | 97.33% |
| මුළු එකතුව | **1,705,700,000** | **1,061,625,703** | **644,074,297** | 62.24% |

## 2.8. දෙපාර්තමේන්තු ආදායම් සාරාංශය - 2018

| ආදායම් සංකේත අංකය | ආදායම් විස්තර | ලද ආදායමේ එකතුව (රු.) |
|---|---|---|
| 2002-01-01 | නිවාස කුලී | 6,312,196.00 |
| 2002-02-99 | ණය පොලී | 4,347,838.00 |
| 2003-01-00 | දෙපාර්තමේන්තු විකිණීම් | 54,313,223.00 |
| 2003-02-99 | වෙනත් | 5,163,708.00 |
| 2003-99-00 | වෙනත් ලැබීම් | 5,963,509.00 |
| 2002-01-99 | වෙනත් කුලී | - |
| | එකතුව | **76,100,474.00** |

## පොදු තැන්පත් ගිණුම - 2018

දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුමේ ශේෂය 2018.12.31 දිනට රු. 21,593,645.79 කි.

එය පහත පරිදි සකස් වී ඇත :

6000/0000/00/0001/0110/000 - 927,170.96
6000/0000/00/0013/0106/000 - 5,296,378.31
6000/0000/00/0016/0098/000 - 12,595,921.52
6000/0000/00/0002/0153/000 - 2,774,175.20

## 2.9. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

| | වාර්ෂික ඇස්තමේන්තු සීමාවන් | තථ්‍ය වටිනාකම (රු.) |
|---|---|---|
| ඉ/ගෙ ශේෂය | | 81,154,418.00 |
| උපරිම බැර සීමාව | 23,000,000.00 | 32,459,491.51 |
| උපරිම හර සීමාව | 39,000,000.00 | 43,832,630.60 |
| උපරිම බැර සීමාවේ ශේෂය | 120,000,000.00 | 92,527,557.13 |
| | සීමාවන් වලට බල නොපාන හර | 4,843,020.60 |
| | ප/ගෙ ශේෂය | 92,527,557.13 |